# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,922 — 1970 සැප්තැම්බර් 4 වැනි සිකුරාදා — 1970.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 653 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 654 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 656 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 657 |
| ආණ්ඩුවේ නිවේදන | 657 |
| මිළ පාලන දන්වීම් | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම් ... | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ | — |
| විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... | 664 |
| 'සුරාබදු ආඥාපනත'' පිළිබඳ දන්වීම් | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමලේඛනයක් ද ඇතුලත් වේ.

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 271

අංකය: ඞී. 41/ආර්ඊසිව් (II).

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද තනතුරක් අත්හැර යාම

පහත නම සඳහන් නිළධාරියා 1970 මැයි මස 23 වැනි දින සිට, 1 වැනි ගැමුණු සේවා බල ඇණියේ වැඩබලන අණදෙන නිළධාරි තනතුර අත්හරින ලදී :—

මේජර් මනෝහර් මඩවල, ගැ. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවෙල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

9-175

1970 අංක 272

අංකය: ඞී. 250 ආර්ඊසිව්/3 (III).

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම ඉදිරියේ සඳහන් කර ඇති දිනයන්හි සිට තාවකාලික මේජර්වරුන් වශයෙන් :—

කපිතන් තිස්ස රෝලෝ තෝමස් ජයතුංග, ල. සි. රෙ.—1970 ජනවාරි මස 23 වැනි දින සිට.

කපිතන් ශිබතුල් කරීම් සවාහිර්, ල. පා. හ.—1970 නොවැම්බර් මස 15 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවෙල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

9-61

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
**කොළඹ.**

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 අංක 273

අංකය : ඞී. 250/ආර්ඊසිපී/3 (III)

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරි තැන 1970 මැයි මස 13 වැනි දින සිට තාවකාලික මේජර්වරයෙක් වශයෙන් :—

කපිතාන් හැම් සිංහසේන විජේසිංහ, ල. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 20 දින,
කොළඹ දී ය.

9-60

---

1970 අංක 274

අංකය : ඞී. 250/ආර්ඊසිපී/3 (III).

### යුද්ධ හමුදව—සථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරි තැන 1970 මැයි මස 14 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් වබුගේ මිත්‍රරත්න වීරසූරිය, ල. ඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

9-176

---

1970 අංක 275

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

අංකය : ඞී. 250/ආර්ඊසිපී/2 (II)

පහත නම් සඳහන් නිලධාරීන් 1970 මාර්තු මස 1 වැනි දින සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් හෙන්රි පාලිත ජයසූරිය, ල. කා. හ.

ලුතිනන් ගැමුණු පැරකුම් කුලතුංග, ල. සි. රෙ.

ලුතිනන් හපු ආරච්චිගේ සෝමදාස, ල. සි. රෙ.

ලුතිනන් හඳපාන්ගොඩගේ සිරිපාල, ගැ. හේ. බ.

ලුතිනන් අනෝම තිස්ස තාබුගල, ල. යු. යු. බ.

ලුතිනන් තියඩෝර් ගොඩ්වින් තිලකරත්න, ල. කා. හ.

ලුතිනන් මහින්ද දිසානායක, ල. යු. පොදු. සේ. බ.

ලුතිනන් තිලකපාල රත්නසේකර, ල. යු. සේ. බ.

පහත නම් සඳහන් නිලධාරීන් 1970 මාර්තු මස 11 වැනි දින සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් පටුවත විතානගේ ජයන්ත ද සිල්වා, ල. පා. හ.

ලුතිනන් චන්ද්‍රිකා සිරිලාල් වීරසූරිය, ල. කා. හ.

ලුතිනන් තුවන් ඩල්කීත් සම්බෝන්, ල. කා. හ.

ලුතිනන් හේරත් මුදියන්සේලාගේ කරුණාරත්න, ගැ. හේ. බ.

ලුතිනන් ජාලිය නම්මුණි, ල.සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 20 දින,
කොළඹ දී ය.

9-59

---

1970 අංක 276

අංකය : ඞී. 250/ආර්ඊසිපී/1

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 1970 අප්‍රේල් මස 5 වෙනි දින සිට ලුතිනන්වරුන් වශයෙන් :—

දෙවැනි ලුතිනන් රන්ජිත් ඒකනායක, ල. ඉ.

දෙවැනි ලුතිනන් කුකුලගේ සිසිර කුමාර පෙරේරා, ල. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

9-62

---

1970 අංක 277

අංකය : ඞී.1/ආර්ඊසිපී/73

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

1970 සැප්තැම්බර් මස 2 වැනි දින සිට පහත නම් සඳහන් කර ඇති මහත්වරුන් පෙන්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය පිළිවෙල අනුව, යුද හමුදා ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිනන්වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීම සහ එම දින සිට ඔවුන්ගේ නම ඉදිරියෙන් සඳහන් කර ඇති බලකා/රෙජිමේන්තුවලට ඇතුලත් කිරීම අනුමත කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ප්‍රසාදය පලකොට ඇත :—

ශිෂ්‍ය භට නිලධාරි චෛත්‍යසේන ලක්ෂ්මන් ජෙෆ්‍රි කන්ත්‍රිආරච්චි—ලංකා පාබල හමුදාව.

ශිෂ්‍ය භට නිලධාරි ආනන්ද කුමාර් සූරියබණ්ඩාර—ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු.

ශිෂ්‍ය භට නිලධාරි සාවුල් හමීඩ් මොහොමඩ්—ලංකා ඉංජිනේරු බලකාය.

ශිෂ්‍ය භට නිලධාරි ලොහාන් ක්ලෙමන්ට් රුද්‍රිගු ගුණවර්ධන—ලංකා කාලතුවක්කු හමුදාව.

ශිෂ්‍ය භට නිලධාරි වෙලතන්තිරිගේ විපුල් සුචින්ද්‍ර බෝතේජු—ගැමුණු හේවා බල ඇණිය.

ශිෂ්‍ය භට නිලධාරි අගත්ගම ගමගේ ජයන්ත චන්ද්‍රසිරි ඩයස්—ලංකා සන්නාහ සන්නද්ධ බලකාය.

ශිෂ්‍ය භට නිලධාරි දළුවතු මුල්ල ගමගේ සරත්චන්ද්‍ර—ලංකා යුද හමුදා සේවා බලකාය.

ශිෂ්‍ය භට නිලධාරි ගල්යේනගේ වසන්ත විමලසිරි පෙරේරා—ලංකා සිංහ රෙජිමේන්තුව.

ශිෂ්‍ය භට නිලධාරි අරසකුලසූරිය ඔත්ස්ලො ක්ලෝඩ් නෙවිල් ප්‍රනාන්දු—ලංකා යුද හමුදා යුද්ධායුධ බලකාය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 27 දින,
කොළඹ දීය.

9-243

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 278

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත :—

අංකය : සීජේපී/එන්. 2/53.

ඞී. පී. තිස්සංග මහතා 1970 අගෝස්තු මස 24 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් ගාල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේ. එල්/ඞී. 25/63.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඞී. බී. රණසිංහ මහතා 1970 අගෝස්තු මස 17 සහ 18 දිනයන්හි ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ගම්පහ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 12/65.

සී. මනෝහරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු වී. යූ. ප්‍රනාන්දු මහතා 1970 අගෝස්තු මස 18 දින සිට 20 දින දක්වා කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඞී. 30/66.

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඞී. සේරසිංහ මහතා 1970 අගෝස්තු මස 19 දින සහ 22 දින සිට 24 දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේජේ. 1/48.

ඞී. පී. බී. මහදිවුල්වැව මහතා 1970 අගෝස්තු මස 20 වැනි දින සිට අනුරාධපුර මහෙස්ත්‍රාත් උසාවියේ අංක ඒ 34867 දරණ නඩුවේ දඬුවම් නියම කිරීම පිණිස අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඞී. 26/63.

එම්. ඊ. ධර්මවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එස්. සුරවීර මහතා 1970 අගෝස්තු මස 15 සහ 16 දිනයන්හි කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ් : 10/65.

ඞී. ඞී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. මතවරාජා මහතා 1970 අගෝස්තු මස 22 දින සිට 25 දින දක්වා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 අගෝස්තු මස 22 සහ 23 වැනි දිනයන්හි වව්නියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් තබුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/ඊ. 4/59.

ඞී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1970 අගෝස්තු මස 20, 21, 22 24, 25, 26, 27, 28, 29 සහ 30 වැනි දිනයන්හි කුරුණෑගල වැලඹිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එජ්. 3/64.

ඩබ්. ඒ. බී. ඕ. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ටී. යූ. කරවිට මහතා 1970 අගෝස්තු මස 14 වැනි දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු නුරුළු පලාත, දකුණු නුරුළු පළාත සහ මැද නුරුළු පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 7/64.

අයි. තිරුපාකරන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු සී. රාසයියා මහතා 1970 අගෝස්තු මස 24, 25, 26, 27 සහ 28 වැනි දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ දිවයින්වල සහ බටහිර වලිකාමම්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 අගෝස්තු මස 21 සහ 22 දිනයන්හි වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඞී. 8/59.

ඇජ්. ජී. බී. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1970 අගෝස්තු මස 17, 18, 19, 20, 21, සහ 22 වැනි දිනයන්හි ගාල්ල දිස්ත්‍රික්කයේ ගහබොඩ සහ ගිනිදූම් පත්තු ගම්බද උසාවි සභාපති සහ වැල්ලබඩ පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අගෝස්තු මස 26 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

9-247

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 279**

පා 4/සාවි 20/191., පා 4/සාවි 20/187.,
පා 4/සාවි 20/190., පා 4/සාවි 9/200.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජුසේ මරියා ජයමාන්න වන මම—

(1) සුබ්‍රමනියම් කන්දසාමි මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයකු වශයෙන් ද,

(2) අප්පාපිල්ලෙයි සිවයෝගනාදන් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(3) මොහමඩ් අබ්දුල් කාදර්, සුල්තාන් අබ්දුල් කාදර් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(4) සියඹලාපිටිය විජයරත්න මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 අගෝස්තු මස 28 වැනිද,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-240

---

**1970 අංක 280**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මහමඩවිලගේ ජේම්ස් වික්මන් සිල්වා මහතා පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

9-3/1

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1970 අංක 281

මෙහි පහත සඳහන් පත්කිරීම 1970.8.1 දින ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත :—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II ශ්‍රේණියේ ලිපිකරු ඇස්. කරුණානායක මහතා බලපිටිය කාර්යාලයයේ සේවය කරමින් ගාල්ල පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

එ. පෙ. කුමාරගේ,
වැඩබලන රෙජිස්ට්‍රාර් ජනරාල්.

1970 අගෝස්තු මස 20 දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

9-4

---

## ආණ්ඩුවේ නිවේදන

සි. 33/63(II)

### නිවේදනය

1970 ජූලි මස 17 වැනි දිනැති අංක 14,915 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 ජූලි මස 4 වැනි දින දරන නිවේදනය මගින් සංශෝධනය කරන ලද 1970 අප්‍රේල් මස 19 වැනි දිනැති අංක 14,902/2 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 අප්‍රේල් මස 18 වැනි දින දරන ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ :—

(1) ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට යා කොට ඇති තනතුරු උපලේඛනයේ III වැනි පන්තිය යටතේ පහත සඳහන් තනතුර ඇතුළත් කරන්න :—

"නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහායකවරයාගේ ලේකම්"

(2) ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට යා කොට ඇති තනතුරු උපලේඛනයේ IV වැනි පන්තිය යටතේ පහත සඳහන් තනතුර ඇතුළත් කරන්න :—
"මුස්ලිම් පල්ලි හා මුස්ලිම් පුණ්‍යාධාර කොමසාරිස්"

(3) * ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වැනි ඡේදය අගට පහත දැක්වෙන වචන එකතු කරන්න :—

"ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට අන්තර් ග්‍රහණය කරන ලද නිලධාරීන්, වයස අවුරුදු 50 ට පැමිණුනු විට, III වැනි පන්තියට උසස් කිරීමේ කාර්‍යය සඳහා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ"

(4) * 41 වැනි ඡේදය අගට පහත දැක්වෙන වචන එකතු කරන්න :—

"ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට අන්තර් ග්‍රහණය කරන ලද නිලධාරීන්, වයස අවුරුදු 50 ට පැමිණුනු විට, III වැනි පන්තියට උසස් කිරීමේ කාර්‍යය සඳහා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ."

* මෙම සංශෝධනය 1970 ජූනි මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(5) † 4 වැනි ඡේදයෙහි දැක්වෙන "භාණ්ඩාගාරයේ ලේකම් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ස්ථිර ලේකම්වරුන්" යන වචන කපාහැර, "රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද. වෙනත් ස්ථිර ලේකම්වරුන්" යන වචන ආදේශ කරන්න.

(6) †22 වැනි, 30 වැනි, 31 වැනි සහ 42 වැනි ඡේදයන්හි දක්වෙන "භාණ්ඩාගාරයේ ලේකම්" යන වචන කපාහැර ඒ වෙනුවට "රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්" යන වචන ආදේශ කරන්න.

(7) †34 වැනි ඡේදයෙහි දැක්වෙන "භාණ්ඩාගාරයේ ලේකම්ගේ" යන වචන කපාහැර ඒ වෙනුවට "රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ" යන වචන ආදේශ කරන්න.

† මෙම සංශෝධන 1970 මැයි මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 1,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී ය.

9-229

---

### සමිති ආඥපනත

(123 වැනි අධිකාරය වන) සමිති ආඥපනතෙහි 3 වැනි සහ 4 වැනි වගන්ති වලින් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මේ නිවේදනයෙන්—

"ශ්‍රී පරමානන්ද විල්බරත්ස් හෝම් ඇන්ඩ් ආශ්‍රම සොසයිටි ලිමිටඩ්" යන නමින් යුත් සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථය ඒ ආඥපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයක් වශයෙන් නියම කරමි.

ටී. බී. ඉලංගරත්න,
දේශීය හා විදේශීය වෙළඳ ඇමති.

1970 අගෝස්තු 18,
කොළඹ දී ය.

9-153

---

### ගම්බද උසාවි ආඥපනත

#### දන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ ඉහළ ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ මහව මාදුරුගම පිහිටි, උතුරට මහව ගාල් ගබඩාව සඳහා වෙන් කර ඇති බිම ද, නැගෙනහිරට බිම් සැටි අංක 108 හි ඉතිරි බිම් කොටසින් ද, දකුණට බිම් සැටි අංක 108 යි ඉතිරි බිම් කොටසින් ද, බස්නාහිරට මහව නාගොල්ලාගම මාර්ගයෙන් ද, මායිම් වූ 1850 අවසාන ගම් සිතියමේ කොටසේ අංක 35/108 දරණ අක්කර 1 ක විශාලත්වයකින් යුත් භූමි භාගයේ පිහිටි ගොඩනැගිල්ල මහව ගම්බද උසාවියේ උසාවි ශාලාව වශයෙන් පැවිදිවි කිරීම සඳහා (8 වැනි අධිකාරයවන) ගම්බද උසාවි ආඥපනතෙහි 19(2) වන වගන්තිය යටතේ අධිකරණ ඇමති වරයා විසින් වෙන් කර තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 25 වෙනි දින,
කොළඹ දී ය.

9-218

---

### පඩිපාලක සභා ආඥපනත

#### නිවේදනය

136 වැනි අධිකාරය වන පඩිපාලක සභා ආඥපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම කරන ලද බව වර් 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ පී. සංගරපිල්ලේ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියම කොට පත් කරනු ලැබූ සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට එච්. ඇම්. කිරිබණ්ඩා මහතා.

(2) රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ පී. සංගරපිල්ලේ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියම කොට පත් කරනු ලැබූ සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට පී. ඒ. බුද්ධදාස මහතා.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර
ලේකම්.

1970 අගෝස්තු මස 28 වන දින,
කොළඹ දී ය.

9-237

ඇල්.ඩී.—බී. 286/30

## අපරාධ නඩු විධාන සංග්‍රහය

(20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 253අ වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝගය.

මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 21 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1937 ඔක්තෝබර් 21 වැනි දින අංක 7,611 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කැරුණු 1970 සැප්තැම්බර් 4 වන දින සිට පහත දක්වේ න පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 4 වැනි නියෝගයේ (4) වැනි ඡේදයේ " වියදම් ගෙවීම, නඩුව විසදීමට තැබීමෙන් පසු, සුළු අපරාධ විනිශ්චයකරුගේ සහතිකය පිට කළ හැකි ය. " යන වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

" වියදම් ගෙවීම, නඩුව විසදීමට තැබීමෙන් පසු, සුළු අපරාධ විනිශ්චයකරුගේ සහතිකය පිට, කළ හැකි ය :

එසේ වුව ද පශ්චාද් මරණ පරීක්ෂණයක් පවත්වා ඇති යම් විශ්ව විද්‍යාලයක වෛද්‍ය විද්‍යා පීඨයේ යම් වෛද්‍ය සාක්ෂි කරුවකු සුළු අපරාධ විනිශ්චයකරු ඉදිරියට සාක්ෂි දුන් විගස ඒ සාක්ෂිකරුගේ පැමිණීම සඳහා වූ වියදම් ඔහුට ගෙවිය හැකි ය. " ;

(2) එහි වූ අ උපලේඛනයේ " සාක්ෂිකරුවන් " යන ශීර්ෂය යටතේ නිශ්චිත ප්‍රමාණ වෙනුවට පහත දක්වෙන අලුත් ප්‍රමාණ ආදේශ කිරීමෙන්:—

ප්‍රමාණ (සියලුම පළාත්)

| පංතිය | | දිනකට බටා | | | තනි සැතැපුමකට ගමන් වියදම් දීමනාව | | මහජන වාහනයක ගමන් කිරීමට හිමිකම් ලත් පංතිය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | ශත | | |
| I | ... | 15 | 0 | ... | 65 | ... | පළමුවැනි |
| II | ... | 12 | 0 | ... | 55 | ... | පළමුවැනි |
| III | ... | 9 | 0 | ... | 40 | ... | දෙවැනි |
| IV | ... | 6 | 0 | ... | 35 | ... | තුන්වැනි |
| V | ... | 3 | 0 | ... | 35 | ... | තුන්වැනි ; |

(3) එහි වූ ආ උපලේඛනයේ " ජූරි සභිකයන් " යන ශීර්ෂය යටතේ නිශ්චිත ප්‍රමාණ වෙනුවට පහත දක්වෙන අලුත් ප්‍රමාණ ආදේශ කිරීමෙන් :—

ප්‍රමාණ (සියලුම පළාත්)

| පංතිය | | දිනකට බටා | | | තනි සැතපුමකට ගමන් වියදම් දීමනාව | | මහජන වාහනයක ගමන් කිරීමට හිමිකම් ලත් පංතිය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | ශත | | |
| I | ... | 17 | 0 | ... | 65 | ... | පළමුවැනි |
| II | ... | 12 | 0 | ... | 55 | ... | දෙවැනි |
| III | ... | 9 | 0 | ... | 40 | ... | දෙවැනි ; සහ |

(4) එහි වූ ඇ උපලේඛනයේ " උපදේශකවරුන් " යන ශීර්ෂය යටතේ නිශ්චිත ප්‍රමාණ වෙනුවට පහත දක්වෙන අලුත් ප්‍රමාණ ආදේශ කිරීමෙන් :—

ප්‍රමාණ (සියලුම පළාත්)

| පංතිය | | දිනකට බටා | | | තනි සැතපුමකට ගමන් වියදම් දීමනාව | | මහජන වාහනයක ගමන් කිරීමට හිමිකම් ලත් පංතිය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | ශත | | |
| I | ... | 17 | 0 | ... | 65 | ... | පළමුවැනි |
| II | ... | 12 | 0 | ... | 55 | ... | දෙවනි |

9-52

---

ඇල්.ඩී.—බී. 80/44

## පඩි පාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යෝජිත තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහතකී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1970 සැප්තැම්බර් මස 18 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක් ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

ඩබ්. එල්. පී. ද මැල්,
ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

කලාම්මමෙ වැඩවලට ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණ සම්බන්ධයෙන් ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබද පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1966 මාර්තු 25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙහි උපලේඛනයේ දක්වා ඇති තීරණ, එම උපලේඛනයේ IIවන කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතු ය:—

### II වන කොටස

කාලම්මමෙ වැඩවලට ගෙවිය යුතු අඩු ම වේතන ප්‍රමාණ :—

(1) මූලික ප්‍රමාණයකින් ; සහ

(2) මෙහි පහත දක්වා ඇති පරිදි විශේෂ දීමනාවකින් යුක්ත විය යුතු ය—

| (1) කම්කරුවාගේ පන්තිය | (2) වැඩ කරන සාමාන්‍ය දවසක මූලික ප්‍රමානය | (3) කවර මාසයක වුව ද වැඩ කරන දවසකට ගෙවිය යුතු විශේෂ දීමනාවේ ප්‍රමානය | | |
|---|---|---|---|---|
| | | (අ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 වූ අවස්ථාවක විශේෂ දීමනාව විය යුත්තේ | (ආ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0 අවස්ථාවක විශේෂ දීමනාව විය යුත්තේ | (ඇ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1ට වැඩි වූ විට හෝ 100·0ට අඩුවූ විට එය 100·1ට ඉහළ ගෙනයන හෝ 100.0ට පහළ ගෙනයන හෝ සෑම අංක 1·8ටේ සම්පූර්ණ ඒකකයට (ඒකකයේ ඛණ්ඩ ගණන් ගනු නොලැබේ) පහත දක්වෙන ප්‍රමාණයන් අනුව පිළිවෙළින් මෙහි පහත 1 වන හා 2 වන චක්‍රයන්හි නිදර්ශිත පරිද්දෙන් ගණන් බලා එන මුදලකින්, උචිත පරිද්දෙන් පෙරාතුව වූ (අ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය වැඩිකළ යුතුය ; නැතහොත් 3 (ආ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය අඩුකළ යුතුය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| I (අ) ශ්‍රේණිය.—මෝස්තරකරුවෝ හෝ ඩිසයින්වරු, ඇඳුම් මහන්නෝ ... ... | 4 0 ... | 3 22 ... | 3 17 ... | 0 05 |
| I (ආ) ශ්‍රේණිය.—ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලක වරු ... ... ... | 3 10 ... | 8 22 ... | 3 17 ... | 0 05 |
| II වන ශ්‍රේණිය.—ඇඳුම් කපන්නෝ, (අතින්) ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත්වැඩියා කරන්නෝ, අවසාන වරට හරිවැරදි බලන්නෝ ... ... | 1 95 ... | 2 85 ... | 2 82 ... | 0 03 |
| III වන ශ්‍රේණිය.—හරිවැරදි බලන්නෝ සහ තෝර න්නෝ, රෙදි මදින (පිරිමි) කම්කරුවෝ, විවිධ වැඩකරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, මහන යන්ත්‍ර ක්‍රියා කර වන්නෝ, රෙදි මදින (ගැහැණු) කම්කරුවෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ ... ... | 1 65 ... | 2 75 ... | 2 72 ... | 0 03 |
| IV වන ශ්‍රේණිය.—රෙදි අතුරන්නෝ (පිරිමි) රෙදි අතුරන්නෝ (ගැහැණු) අහුරන්නෝ, සෙලෝපේන්ට මළු හා කඩදාසි පෙට්ටි සාදන්නෝ ... | 1 40 ... | 2 53 ... | 2 50 ... | 0 03 |
| V වන ශ්‍රේණිය.—ආධුනිකයින් සහ පුහුණුවන්නන් ... | 1 05 ... | 2 38 ... | 2 36 ... | 0 02 |

ඉහත සඳහන් යම් වෘත්තිය ආධුනිකයෙකු ගේ හෝ පුහුණු වන්නෙකු ගේ ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත විය යුතු ය.

### I වන චක්‍රය

ජීවන වියදම් අංකයේ ඉහළ නැගීමක් ඇති වුවහොත් ගෙවිය යුතු විශේෂ දීමනාව

| ජීවන වියදම් අංකය | I (අ) හා I (ආ) ශ්‍රේණි | II වන ශ්‍රේණිය | III වන ශ්‍රේණිය | IV වන ශ්‍රේණිය | V වන ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 100.1–101.8 ... ... ... | 3 22 ... | 2 85 ... | 2 75 ... | 2 53 ... | 2 38 |
| 101.9–103.6 ... ... ... | 3 27 ... | 2 88 ... | 2 78 ... | 2 56 ... | 2 40 |
| 103.7–105.4 ... ... ... | 3 32 ... | 2 91 ... | 2 81 ... | 2 59 ... | 2 42 |
| 105.5–107.2 ... ... ... | 3 37 ... | 2 94 ... | 2 84 ... | 2 62 ... | 2 44 |
| 107.3–109.0 ... ... ... | 3 42 ... | 2 97 ... | 2 87 ... | 2 65 ... | 2 46 |
| 109.1–110.8 ... ... ... | 3 47 ... | 3 0 ... | 2 90 ... | 2 08 ... | 2 48 |
| 110.9–112.6 ... ... ... | 3 52 ... | 3 03 ... | 2 93 ... | 2 71 ... | 2 50 |
| 112.7–114.4 ... ... ... | 3 57 ... | 3 06 ... | 2 96 ... | 2 74 ... | 2 52 |

### II වන චක්‍රය

ජීවන වියදම් අංකයේ පහළ බැසීමක් ඇති වුවහොත් ගෙවිය යුතු විශේෂ දීමනාව

| | | | | | |
|---|---|---|---|---|---|
| 100.0–98.3 ... ... ... | 3 17 ... | 2 82 ... | 2 72 ... | 2 50 ... | 2 36 |
| 98.2–96.5 ... ... ... | 3 12 ... | 2 79 ... | 2 69 ... | 2 47 ... | 2 34 |
| 96.4–94.7 ... ... ... | 3 07 ... | 2 76 ... | 2 66 ... | 2 44 ... | 2 32 |
| 94.6–92.9 ... ... ... | 3 02 ... | 2 73 ... | 2 63 ... | 2 41 ... | 2 30 |
| 92.8–91.1 ... ... ... | 2 97 ... | 2 70 ... | 2 60 ... | 2 38 ... | 2 28 |

භාණ්ඩාගාර අංකය : පී. එන්./137/69/පී.

පහත සඳහන් සේවය සඳහා ද්විතියනය කරන ලද නිලධාරියාගේ තාවකාලික වෘත්තියෙහි සේවා කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 24 වැනි වගන්තියේ කොන්දේසි අනුව විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීමට අනුමත කරන බව මෙයින් නිවේදනය කරමි.

| නම | විශ්‍රාම වැටුප් සහිත පත්වීම | ද්විතියනය කරන ලද තනතුර |
|---|---|---|
| ඊ. ඩී. ඩී. ද අල්විස් මහතා ... | 11 ශ්‍රේණියේ සහකාර දුම්රිය ස්ථානාධිපති... | ලංකා දුම්රිය සුභ සාධක සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරික. |

බී. මහදේව,
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 29 දින,
කොළඹ දී ය.

9–154

---

## මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාධාර නොහොත් වකූප් මණ්ඩලය

1956 අංක 51 දරණ මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාධාර භාර නොහොත් වකූප් පනතේ 5 (1) වගන්තිය යටතේ, මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාධාර භාර නොහොත් වකූප් මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් 1970 අගෝස්තු මස 17 වන දින සිට 1972 ඔක්තෝබර් 31 වන දින දක්වා පහත සඳහන් අය රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ :—

1. කාදර් මීරා සාහිබ් මහතා, පෙරකදෝරු හා ප්‍රසිද්ධ නොතාරිස්, කල්මුනේ.
2. ඊ. එම්. හනීපා මහතා, කොට්ඨාශ අංක 6, කින්නියා.
3. අල්හාජ් බී. එම්. ඒ. අතීක් මහතා, 557, පේරාදෙනිය පාර, මහනුවර.
4. එම්. එච්. ඒ. රසාක් මහතා, පෙරකදෝරු හා ප්‍රසිද්ධ නොතාරිස්, පුත්තලම.
5. ඒ. ආර්. අයි. මරික්කාර් මහතා, පෙරකදෝරු හා ප්‍රසිද්ධ නොතාරිස්, මාතර.
6. අයි. එල්. එම්. මසූර් මහතා, "නිසාම්", දර්ගා නගරය.
7. බංස ජයා මහතා, 79, සුමංගල මාවත, කුරුණෑගල.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 අගෝස්තු මස 17 වන දින.

9-82

---

අංක : ඩබ්ලිව් 105/544.

## කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

1957 අංක 14 හා 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 1969 අගෝස්තු 22 දින දරන නියෝගයෙන්, යොමු කරන ලදුව, 1969 සැප්තැම්බර් 5 දින අංක 14,870 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද, එක් පක්ෂයක් වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 532 හි ලංකා ජාතික වතු කම්කරු සංගමය සහ වහරක උතුර සනික්‍රොෆ්ට් වත්තේ දෙවන කොටසේ අයිතිකාරිය වන දෙහිවල ජේපයාර්ලසින් පාරේ අංක 12 හි සී. මනුකුලසූරිය මහත්මිය ද අතර පැවතුන කාර්මික ආරාවුල පිළිබඳව අංක XI දරන කම්කරු විනිශ්චය සභාව විසින් මා වෙත එවන්නට යෙදුණු තීරණය, ඉහත සඳහන් කරන ලද පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් පළකරනු ලැබේ.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ 5,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

## කම්කරු විනිශ්චය සභා (11)

කාර්මික ආරාවුල් පිළිබඳ ලංකා ජාතික වතුකම්කරු සංගමය, 532, ගාලු පාර, කොළඹ 3

සහ

වහරක, උතුරු සනිකෝෆ්ට් වත්තේ දෙවන කොටසේ අයිතිකාරිය වන දෙහිවල, පෙයාලසින් පාරේ, අංක 12 හි සී. මනුකුලසූරිය මහත්මිය අතර පවතින කාර්මික ආරාවුල පිළිබඳවයි

නඩු අංකය : අයි.ඩී./එල්.ටී./11/3/69.

### තීරණය

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එම ඇමතිතුමා විසින් ඉහත සඳහන් ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මෙම කාර්මික විනිශ්චය සභාව වෙත යොමුකර තිබේ.

කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශය අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ වහරක උතුරු සනික්‍රොෆ්ට් වත්තේ දෙවන කොටසේ පාලක පක්ෂය විසින් ඩී. ජේ. ආරොන් සිංඤෝ නොහොත් ඩබ්ලිව්. ඒ. ආරොන් සිංඤෝ මහතා සේවයෙන් පහ කිරීම යුක්ති සහගත ද යන්න හා ඔහුට කුමන සහනයක් හිමිද යන්න වේ.

1970.6.17 වැනි දින මෙම ආරාවුල විභාගයට ගත් අවස්ථාවේදී දෙපක්ෂය අතර සමථයක් ඇති විය. වගඋත්තරකාර පක්ෂය විසින් අයදුම්කරුගේ සියළුම ඉල්ලීම් සඳහා සම්පූර්ණ හා අවසාන සමාදානයක් වශයෙන් රුපියල් 600ක් ගෙවීමට ද අයදුම්කරු විසින් මෙම මුදල ඒ ආකාරයෙන් ලබා ගැනීමට ද එකඟ විය.

ඉහත සඳහන් සමථය අනුව මෙම තීරණය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී සති දෙකකින් මෙපිට එකී රුපියල් 600 වගඋත්තරකාර පක්ෂය විසින් අවිස්සාවේල්ලේ සහකාර කම්කරු කොමසාරිස් තැන වෙත තැන්පත් කළ යුතුය. ඉන්පසු එම මුදල මෙම ආරාවුලට භාජනය වී ඇති සේවකයා වන ඩී. ජේ. ආරොන් සිංඤෝ නොහොත් ඩබ්ලිව්. ඒ. ආරොන් සිංඤෝ නමැත්තාට ඔහුගෙන් ලබා ගැනීමට ඉඩ තිබේ.

පී. කාරියවසම්,
සභාපති, කම්කරු විනිශ්චය සභා (11).

1970 ජූලි මස 26 වැනි දින,
බම්බලපිටියේ, ගාලු පාරේ, අංක 222 දරන ස්ථානයේ පිහිටි කම්කරු විනිශ්චය සභා කාර්යාලයේ දීය.

9-51

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා අඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයා ගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, ගාලු දිස්ත්‍රික්කයේ දොඩන්දූව සුළු නගර සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සියළුම සාමාජිකයින් තිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-34/1

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, ගාලු දිස්ත්‍රික්කය තුළ පිහිටි දෙල්ලව ගම් ප්‍රදේශයේ සමගිදායකයින් ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉවත් කරන ලද ගාල්ල, දෙල්ලව පදිංචි වීරනාත් ද අබේතුංග මහතා වෙනුවට, ගාල්ල, දෙල්ලව පදිංචි මානාභරණ ත්‍රිමහවිතාන මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-34/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමති වරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, ගාලු දිස්ත්‍රික්කයේ දෙල්ලව ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති, ගාල්ල, දෙල්ලව පදිංචි වීරනාත් ද අබේතුංග මහතා තිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-34/3

---

## සමගි මණ්ඩල පනත

### 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රම නායක වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින් ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින් ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැන ගේ කාර්යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1970 ඔක්තෝබර් 15 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

(1) මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි ගඟ ඉහළ උඩපළාත ගම් ප්‍රදේශය,
(2) ගාලු දිස්ත්‍රික්කය තුළ පිහිටි නෙලුව ගම් ප්‍රදේශය,
(3) මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි නාවිමන-මාකාවිට ගම් ප්‍රදේශය,
(4) මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි කනංකෙ ගම් ප්‍රදේශය,
(5) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි හෝමාගම සුළු නගර සභා ප්‍රදේශය,
(6) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි පල්ලෙවෙල ගම් ප්‍රදේශය,
(7) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුගහ ගම් ප්‍රදේශය.

9-217

---

## නොතාරිස් ආඥපනත

### දැන්වීමයි

මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ආඥව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවා ඇති බව (107 වන අධිකාරය වන) නොතාරිස් ආඥපනතෙහි 25 (2) වන වගන්තිය අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970 අගෝස්තු මස 18 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

#### නොතාරිස් ආඥපනත

(107 වන අධිකාරය වන) නොතාරිස් ආඥපනතේ 25 (1) වන වගන්තිය යටතේ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥව යි.

fපිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 අගෝස්තු 18 වැනි දින,
කොළඹ දී ය.

#### ආඥව

පානදුර අධිකරණ කොට්ඨාශය තුළ ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට මහමඩිගේ ජේම්ස් වික්මන් සිල්වා මහතාට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම මෙයින් නිෂ්ප්‍රභා කරනු ලැබේ.

9-3/2

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ ඒ. ජේප්‍රාන්බර් මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් ඇල්. කේ. හේවාවිතාරණ මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹදීය.

9-1

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ ඇම්. ජී. මැන්ඩිස් මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් ඩබ්. ඇල්. ප්‍රනාන්දු මහතා පත් කරන ලද බැව් වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
වැඩ බලන ස්ථිර ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

1970 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

9-2

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිටි පඩිපාලක සභා ආඥපනතේ 4(2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන ඇල්. වී. ද සා බණ්ඩාරනායක මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයෙකු ලෙස සෙනි සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් ඩී. ඩී. පෙරේරා මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආ. එ. යෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දීය.

9-45

---

ඇල්.ඩී.—බී. 34/57.

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වැනි වගන්තියෙන් ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නියමිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එකී සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහතකී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1970 සැප්තැම්බර් මස 18 දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක් ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්.
ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12,617 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද 1963 අගෝස්තු මස 30 වැනි දින අංක 13,742 දරන ගැසට් නිවේදනයෙහි උපලේඛනයෙන් සහ 1969 අගෝස්තු මස 29 වැනි දින අංක 14,869 දරන ගැසට් නිවේදනයෙහි උපලේඛනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ, එම උපලේඛනයෙහි V වැනි කොටසේ "ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)" යන ශීර්ෂය යටතේ ඇති 8 වැනි ඡේදයේ (අ) අනුච්ඡේදය වෙනුවට පහත දැක්වෙන අළුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වන වගන්තිය)

(අ) මෙම ඡේදයෙහි හා 9 වන ඡේදයෙහි දැක්වෙන විධිවිධාන වලට යටත්ව, සෑම සේවා යෝජකයෙකු ම විසින් තමා යටතේ සේවයෙහි යොදවාගෙන සිටින්නා වූ සියළු ම කම්කරුවන්ට, 1965 අංක 17 දරන නිවාඩු පනතේ අර්ථානුකූලව පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතු ය:—

(1) ජාතික වීරවරයින්ගේ දිනය;

(2) දෙමළ තෛපොංගල් දිනය;

(3) නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4);

(4) සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනට පෙරාතුව එන දිනය;

(5) සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය;

(6) මැයි දිනය (මැයි 1);

(7) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය;

(8) මීලාඩ්-උන්-නබි (මොහොමඩ් නබිනායක තුමාණන් වහන්සේගේ උපන් දිනය);

(9) නත්තල් දිනය."

9-150

---

අංකය: ඩබ්ලිව්. 105/848 (එච්).

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව මහනුවර, කන්දේ වීදියේ, අංක 13, ලංකා වතු සේවා සංගමය හා කොළඹ 2, වෑක්ෂෝල් වීදියේ අංක 148, විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ් බාරේ රම්බොඩ, ෆේප්‍රාවෝජ් වතුයායේ අයිතිකරුවන් වන අප්ලන්ඩ්ස් ටී එස්ටේට්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර අධිනීතිඥ ඊ. බී. රත්නායක මහතා මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 24 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

### 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

මහනුවර,
කන්දේ වීදියේ,
අංක 13,
ලංකා වතු සේවා සංගමය
සහ

කොළඹ 2, වෑක්ෂෝල් වීදියේ අංක 148, විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ් බාරේ, රම්බොඩ, ෆේප්‍රාවෝජ් වතුයායේ අයිතිකරුවන් වන අප්ලන්ඩ්ස් ටී එස්ටේට්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල නම්,

රම්බොඩ, ෆේප්‍රාවෝජ් වතුයායේ ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු තනතුර සඳහා ජී. එම්. ටී. ද සිල්වා මහතා උසස් නොකිරීම යුක්ති සහගතද සහ ඔහුට කුමන සහනයක් හිමිද යන්න වේ.

1970 අගෝස්තු මස 21 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

9-49

---

අංකය: සී/අයි. 1094.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදියේ, කොළඹ 2, හා රබර් ඉන්වෙස්ට්රිස් කලම්බු ලිමිටඩ්, 451, වේල්ස් කුමාර මාවත, කොළඹ 14, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන

වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XIII වෙත මෙයින් යොමු කරනු ලැබේ.

1970 අගෝස්තු මස 24 දින,
කොළඹ දීය.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය,

71, මැලේ වීදිය, කොළඹ 2

සහ

රබර් ඉන්ඩස්ට්‍රීස් කලම්බු ලිමිටඩ්,
451, වේල්ස් කුමාර මාවත,
කොළඹ 14

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම්, කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතියේ සාමාජිකයන් වන පහත නම් සඳහන් වන සේවකයන් රබර් ඉන්ඩස්ට්‍රීස් කලම්බු ලිමිටඩ් විසින් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද, එවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

සේවකයන්ගේ නම්

ලිපිකාර

1. එන්. එස්. සිල්වා,
2. ටී. ඒ. ඇන්තනි සිල්වා,
3. ටී. ඩී. ෆ්‍රැන්සිස්,
4. එච්. ද ඩබ්. ගුණවර්ධන,
5. ක්‍රිස්ටෝපර් කුලතුංග.

කර්මාන්තශාලා සේවකයන්

1. ඒ. ඒ. ගුණසේකර,
2. එච්. එම්. ගුණසේකර,
3. කේ. සිමියොන්,
4. එච්. විමලදාස,
5. ටී. නාහිම්,
6. ඩී. ආර්. සිරිපාල,
7. සිරිපාල අල්විස්,
8. බී. ඒ. පීටර් පෙරේරා,
9. බී. ඒ. රූපසිල,
10. ඩී. ජේ. එම්. අබේරත්න,
11. ආර්. ඩී. පීටර්,
12. එස්. රාජපක්ෂ,
13. ඒ. එම්. ඒ. කෝස්තා,
14. වී. ජී. ආරියදාස,
15. සෝමසිරි පෙරේරා,
16. ලයනල් වීරසූරිය,
17. බී. ආර්. එල්. මෙන්ඩිස්,
18. මැන්ඩිස් වත්තගේ,
19. යූ. ඩී. ප්‍රේමරත්න,
20. කුමල් ප්‍රනාන්දු
21. ජේ. ඒ. පියරත්න,
22. ජයතිස්ස වත්තගේ,
23. කේ. ඩී. විල්ෆ්‍රඩ්,
24. ආර්. එස්. ගජසිංහ,
25. මෙරිල් නිමල්සත් ප්‍රනාන්දු
26. ඒ. ඒ. ගුණදාස,
27. ආර්. ඒ. හෙන්රි පෙරේරා,
28. වී. සෝමපාල,
29. බී. ඒ. ඩබ්. ඕ. විමලසිරි,
30. සී. චාල්ස්.

1970 අගෝස්තු මස 18 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

9-58

අංකය : සී/අයි. 649.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා සිනමා සහ චිත්‍රාගාර සේවක සමිතිය, 123, යූනියන් පෙදෙස, කොළඹ 2 හා සිනමාස් ලිමිටඩ්, 117, අළුත්හෙට්ටි වීදිය, කොළඹ 13 අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ, නීති පුස්තකාලයේ අධිනීතිඥ අයිවන් පෙරේරා මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 24 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ලංකා සිනමා සහ චිත්‍රාගාර සේවක සමිතිය,
123, යූනියන් පෙදෙස,
කොළඹ 2.

සහ

සිනමාස් ලිමිටඩ්,
117, අළුත්හෙට්ටි වීදිය,
කොළඹ 13.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණු නම්,

(1) සිනමාස් ලිමිටඩ් යටතේ සේවයේ යොදවා සිටින චිත්‍රාගාර සේවකයන්ටද, ලිපිකාර සේවක මණ්ඩලයට හා විත්‍රපට අංශයේ සේවකයන්ට මෙන්, දෙමසක ඒකාබද්ධ වැටුප ප්‍රසාද දීමනාවක් ලෙස දිය යුතුය යන වෘත්තීය සමිතියේ ඉල්ලීම යුක්ති සහගතද, ඔවුන්ට කුමන සහනයක් හිමිද,

(2) සිනමාස් ලිමිටඩ් සමාගමට අයිති අම්පාරේ සිනමා ශාලාවේ සේවකයන්ට ගෙවන ලද විශේෂ දීමනාව අස්කර ගැනීම යුක්ති සහගතද යන්නත්, මෙම සේවකයන්ට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 අගෝස්තු මස 18 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

9-50

---

අංකය : සී/අයි. 603.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1970.6.25 දින අංක 14,912 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1970.6.13 වන දින දරන නියෝගයෙන් එක්සත් කම්කරු සමිතිය, 51/17, ශාන්ත මයිකල් පාර, කොළඹ 3 සහ නවරාජ් මුද්‍රණාලයේ අයිතිකරුවන් වන නඩරාජා ලිමිටඩ්, නඩරාජා ගොඩනැගිල්ල, 282/8, ගාලුපාර, කොළඹ 3, අතර ඇති 1970.6.13 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා ජී. ටී. අමරසිංහ මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1970.6.13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 25 දින,
කොළඹදීය.

9-163

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

**පාර්ලිමේන්තු මහා මැතිවරණය—1970**

### අංක 80—කෝපායි මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ ඇම්. තුරයිරාජා, මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1970 ජූලි මස 2 වෙනි දින මා වෙත ලැබුණු බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ද සිට ඉදිරියට ඇති හය මාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන්ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී, යාපනය මැතිවරණ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. කන්දසාමි,
සහකාර තේරීම් භාර නිළධාරි තැන,
අංක 80 දරණ කෝපායි මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය, යාපනය,
1970 අගෝස්තු මස 7 වැනි දින.

9-169/1

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

**පාර්ලිමේන්තු මහා මැතිවරණය—1970**

### අංක 81—උඩුප්පිඩ්ඩි මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ පී. කුමාරසාමි මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1970 ජූලි මස 2 වෙනි දින මා වෙත ලැබුණු බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හය මාසය තුළදී රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන්ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී, යාපනය මැතිවරණ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. කන්දසාමි,
සහකාර තේරීම් භාර නිළධාරි තැන,
අංක 81 දරණ උඩුප්පිඩ්ඩි මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය, යාපනය,
1970 අගෝස්තු මස 7 වැනි දින.

9-169/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

**රථ වාහනවලට බාධා**

### දනිකිට්ටව සිට අඹන්පොල දක්වා පාර වසා තැබීම

**වයඹ කොට්ඨාශය** **මාතර දිස්ත්‍රික්කය**

2, 5 හා 6 යන සැතපුම්වල පිහිටි බෝක්කු නැවත සෑදීම හේතු කොට ගෙන දනිකිට්ටව-අඹන්පොල මාර්ගය, 70.8.20 දින සිට 70.9.11 දින අපරභාග 6 දක්වා රථවාහනවලට වසා තබන බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

දනිකිට්ටව සිට අඹන්පොලට යාමට, දලුගම හන්දිය හරහා ඇති මාර්ගය විවෘතව ඇති බව සළකත්ත.

ආර්. ඇලෙක්සැන්ඩර්,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

9-46

ණ. 3927/8887

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1970 මැයි 11 දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී:—

(1) ඒ. එෆ්. බී. ද ඩබ්ලිව්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1962 අප්‍රේල් 26 වෙනි දින හා අංක 727 සහ ඊ. එෆ්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1965 මැයි 10 වෙනි දින හා අංක 10[illegible]4 දරණ උකස්කර මත දෙහිවල, බටහිර කළුබෝවිල, ශ්‍රී සරණංකර පාරේ අංක 167/3 දරණ තැන පදිංචි දැරණියගලගේ විමලාවතී පෙරේරා (විවාහයට පෙර පිරිස්) නමැත්තිය ගෙන් 1970. 2. 2 දින දක්වා මුල් මුදල හා පොලිය වශයෙන් රු. 12,244.19 ක මුදලක් හා 1970. 2. 3 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 6,260.64 ක මුදල මත අවුරුද්දට සියයට 5½ පොලියක් හා රු. 3,882.34 ක මුදල මත අවුරුද්දට සියයට 6½ පොලියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ (398 අධිකාරය) 61 වන වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 1, බේලි වීදියේ අංක 20 දරණ තැන, ඒ. එම්. මාර්සුක් වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී දැරණියගලගේ විමලාවතී පෙරේරා (විවාහයට පෙර පිරිස්) නමැත්තියගෙන් ඉහත සඳහන් උකස්කර මත අයවිය යුතු රු. 12,244.19 ක මුදල සහ 1970.2.3 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 6,260.64 ක මුදල මත අවුරුද්දට සියයට 5½ පොලියක් හා රු. 3,882.34 ක මුදල මත අවුරුද්දට සියයට 6½ පොලියද, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි වියහියදම් හා මුදල් ද අයකර ගනු සඳහා මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති.—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස නාගරික සභාවේ සීමාවන් තුළ කළුබෝවිල, බලය ලත් මිනින්දෝරු ආර්. සී. දිසානායක විසින් සාදන ලද 1964 ජූලි 2 වෙනි දින හා අංක 758/බී2 දරණ පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම අටයි එකක් වූ (අ. 0, රූ. 1, පර්. 24.81) ඉහත කී 758/බී2 පිඹුර අනුව බී 2 වශයෙන් සළකුණු කරන ලද කිරිඅම්මාපරවෙනිවත්ත නමැති ඉඩම සහ ඉහත කී කළුබෝවිල ශ්‍රී සරණංකර පාරට අයිති වරිපනම් අංක 169/4 දරණ ගොඩනැගිලි සහ ඉහත කී අංක 758/බී2 දරණ පිඹුර අනුව බී4 වශයෙන් සළකුණු කරන ලද ඉඩමේ පයින් හා වාහනයෙන් ගමන් කිරීමේ පූර්ණ නිදහස හා අයිතිය සමග.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 ජූනි 23 දින,
කොළඹ.

9-204

---

## වන්දනා ගමන් ආඥපනත

**කොක්කඩිචෝලෙයි තාන්තෝන්රිශ්වරන් කෝවිල් උත්සවය—1970**

යථෝක්ත උත්සවය 1970 සැප්තැම්බර් මස 2 වැනි දින පටන් ගෙන 1970 සැප්තැම්බර් මස 21 වෙනි දින දක්වා පවත්වනු ලබන බව එකී උත්සවය සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියළු දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1952 අගෝස්තු මස 15 දින අංක 10,434 දරණ ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවමි.

ඩී. තේසසියා,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අගෝස්තු මස 24 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

9-292

## 1958 අංක 29 දරන සත්ව පනත

### 1970 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ නින්දවූර් පත්තුවේ ගවයින් සංවඩු ගැසීමේ දිනයන් සහ ස්ථානයන්

| ග්‍රාම සේවක අංකය | ග්‍රා. සේ. කොට්ඨාශය | සංවඩු ගැසීමේ දිනය | සංවඩු ගසන ස්ථානය |
|---|---|---|---|
| 37 | නින්දවූර් 5 වන කොට්ඨාශය | 70.9.23—70.9.24 | ග්‍රාම සේවක කාර්යාලය |
| 38 | නින්දවූර් 4 වන කොට්ඨාශය | 70.9.20—70.9.21 | එම |
| 39 | නින්දවූර් 3 වන කොට්ඨාශය | 70.9.23—70.9.24 | එම |
| 41 | නින්දවූර් 1 වන කොට්ඨාශය | 70.9.20—70.9.21 | එම |
| 42 | කාර්තිව් 3 වන කොට්ඨාශය | 70.9.16—70.9.17 | එම |
| 43 | මාවඩිපල්ලි | 70.9.16—70.9.17 | එම |
| 44 | කාර්තිව් 1 වන කොට්ඨාශය | 70.9.16—70.9.17 | එම |
| 44 ඒ | මාලියකාඩු | 70.9.23—70.9.24 | එම |
| 45 | කාර්තිව් 2 වන කොට්ඨාශය | 70.9.20—70.9.21 | එම |

ආර්. බී. විරකෝන්,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.8.20 දින,
අම්පාර කච්චේරියේ දී ය.

9–7

---

නිති/ණ/977

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥා පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥා පනතේ අංක 5(1) වී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන ධනපාල සිරිපස්න වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහාත් වෙනුවෙනුත් ක්‍රියා කරමින් කොළඹ, එස්. ගුණසේකර, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1960.10.12 දින අංක 1317 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, ඔබ්. එම්. ප්‍රනාන්දු මහතාගෙන් 1970.1.12 දින තෙක් අයවිය යුතු රුපියල් දහසයදාස් අනූවයි ශත තිස්තුන (රු. 16,090.33) අයකර ගැනීම සඳහාත්, එසේම 70.1.12 දින සිට විකිණීම පැවැත් වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් දහදාස් එකසිය විසිඑකයි ශත විසිපහ (රු. 10,121.25) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 3½ ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 70.1.12 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමඟ අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උප ලේඛණයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා කොළඹ, බෙලි වීදියේ අංක 20 හි ඒ. එම්. මසුක් ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1970. 7. 20.

### උපලේඛණය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමා ව තුල, කරගම්පිටියෙහි පිහිටි උතුරින් : එච්. මාෂල් ප්‍රනාන්දුගේ දේපොලින් ද; නැගෙනහිරින් : "1ඕ" දරණ කැබැල්ලෙන් ද (අඩි 12 ක් පළල පාරට වෙන්කරන ලද බිම); දකුණින් : "1ඕ" දරණ කැබැල්ලෙන් සහ බටහිරින් : අඩි 3 ක් පළල අඩි පාරෙන් සහ අංක 6 සහ 9 දරණ මෙම ඉඩමේම කොටස් වලින් ද මායිම් වූ ආර්. සී. දිසානායක, බලයලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 1202 හා 1952. 8. 10 දින දරණ සැලැස්ම අනුව පර්චස් විසිඑකයි දශම හතයි පහක (අක්. 0, රූ. 0, පර්. 21.75) ප්‍රමාණයෙන් යුත් ලියන්ගහවත්ත නොහොත් ලියනගවත්ත නැමැති ඉඩමේ "1 ඒ" දරණ කොටස සහ එහි තනා ඇති පල්ලිදොරපාරේ වරිපනම් අංක 49ඒ දරණ නිවාසය.

පහත සඳහන් පාරට වෙන් කරන ලද කොටස උඩින් පයින් හා වාහන වලින් යෑම් ඊම් කසල පයිප්ප, ජලනල, විදුලි කම්බි සවි කිරීමේ අයිතිය සහ එහි මාර්ග අයිතිය සමග.

පෙරකී කරගම්පිටියේ පිහිටි උතුරින් : එච්. මාෂල් ප්‍රනාන්දුගේ දේපොලින් ද; නැගෙනහිරින් : කැබැලි අංක 2 ලෙස සඳහන් මෙම ඉඩමේම කොටසකින් ද; දකුණින් : පල්ලියදොර පාරෙන් සහ බටහිරින් : 1ඕ සහ 1ඒ දරණ කොටස් වලින් ද, මායිම් වූ ඉහත කී අංක 1202 දරණ සැලැස්ම අනුව පර්චස් අටක (අක්. 0, රූ. 0, පර්. 08) ප්‍රමාණයෙන් යුත් ඉහත කී අංක 1202 දරණ සැලැස්මේ සඳහන් ලියන්ගහවත්ත නොහොත් ලියනගහවත්ත නැමැති ඉඩමේ 1ඩී නැමැති කොටස කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ එම් 494/59 යටතේ ලියා පදිංචි වී ඇති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි. ඉහත කී 1ඩී දරණ කොටස.

9-77

## ලක්සල—කොළඹ

### වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, 1969-70

ඉහත සඳහන් ආයතනය වාර්ෂික තොග ගණන් ගැනීම පිණිස, 1970 සැප්තැම්බර් මස 30 වන දින සිට 1970 ඔක්තෝබර් මස 6 වන දින දක්වා (දෙදිනම ඇතුළුව) වසා තබනු ලැබේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 1.
1970 සැප්තැම්බර් 4 වැනි දින දිය.
9-93

## ගම් නැවත නම් කිරීම—මාතලේ දිස්ත්‍රික්කය

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ලේනාවල ග්‍රාමසේවක කොට්ඨාශය තුළ පිහිටි "බලිගම" යන නම "දංගි රඹෙබඩගල්ල" යනුවෙන් වෙනස් කළ යුතු යයි යෝජනාවක් ඉදිරිපත් වී ඇත. මේ ගැන අදහස් මහජනයා ගෙන් හා මේ පිළිබඳව උනන්දුවක් දක්වන සැම පාර්ශවයක ගෙන්ම, 1970 සැප්තැම්බර් මස 25 වැනි දින තෙක් මවිසින් භාරගනු ලැබේ.

මාතලේ දිසාපති.

1970.8.25 වැනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේදිය
9-151

## සමුපකාර සමිති පිළිබඳ ආඥාපනත (124 වෙනි අධිකාරය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමනලද බව, සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52(2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සීමාසහිත ඇටවල තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... ... | 70. 7. 2 |
| 2. | සීමාසහිත දකුණ බයියවත්ත මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7. 2 |
| 3. | සීමාසහිත ගණේගම මධ්‍යම කාන්තා සමුපකාර සමිතිය ... | 70. 7. 2 |
| 4. | සීමාසහිත කුරුපනාව තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... ... | 70. 7. 2 |
| 5. | සීමාසහිත හඳපාන ශාන්ත මේරි මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7. 2 |
| 6. | සීමාසහිත පුවක්ගහවෙල සමුපකාර කඩ සමිතිය ... | 70. 7. 5 |
| 7. | සීමාසහිත හොංවල ගොවි ද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7. 7 |
| 8. | සීමාසහිත කනංශුද්ධ මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7. 7 |
| 9. | සීමාසහිත ශාන්ත ජෝර්ජ් මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7. 7 |
| 10. | සීමාසහිත සිවපුරම් විවිධ සේවා සමුපකාර සමිතිය ... | 70. 7.16 |
| 11. | සීමාසහිත වැවවත්ත සමුපකාර කඩ සමිතිය ... | 70. 7 17 |
| 12. | සීමාසහිත ගුරුකැලේවත්ත සමුපකාර කඩ සමිතිය ... | 70. 7.19 |
| 13. | සීමාසහිත සැකසුරුවම්කම හා මුදල් ඉතිරි කිරීම පිළිබඳ කුම්පනේ ගම්මුලාදෑනීන්ගේ සමුපකාර සමිතිය ... | 70. 7.19 |
| 14. | සීමාසහිත නාවුල්ල වසමේ තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... ... | 70. 7.19 |
| 15. | සීමාසහිත කිතුල්ගල තරුණ ගොවි සමුපකාර සමිතිය ... | 70. 7.19 |
| 16. | සීමාසහිත අරුප්පල රබර් සැදීමේ සහ විකිණීමේ සමුපකාර සමිතිය ... ... ... | 70. 7.19 |
| 17. | සීමාසහිත වෙලේකුඹුර සමුපකාර කඩ සමිතිය ... | 70. 7.20 |
| 18. | සීමාසහිත උතුරු හුණුවල සමුපකාර ණය දෙන සමිතිය ... | 70. 7.20 |
| 19. | මහනන්කුලම් ශ්‍රී නිලාවන්නි ගෝව ෆාර්මින් සොසයිටි ලිමිටඩ ... ... ... | 70. 7.20 |
| 20. | සීමාසහිත පානහේවාහැට ගම්මුලාදෑනීන්ගේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70. 7.23 |
| 21. | සීමාසහිත අටබාගේ ඉහලගම සමුපකාර කඩ සමිතිය ... | 70. 7.23 |
| 22. | සීමාසහිත නැගෙණහිර මාලමුල්ල සමුපකාර කඩ සමිතිය | 70. 7.23 |
| 23. | සීමාසහිත හැධිදෙනිකන්ද විවිධ සේවා සමුපකාර සමිතිය... | 70. 7.23 |
| 24. | සීමාසහිත කොස්ලන්දවත්ත සමුපකාර කඩ සමිතිය ... | 70. 7.24 |
| 25. | සීමාසහිත හොන්පෙරියල් වතුයාය සමුපකාර කඩ සමිතිය | 70. 7.24 |
| 26. | සීමාසහිත තෙල්දෙනිය ඡන්ද කොට්ඨාශයේ තරුණ ගොවි සමුපකාර සමිතිය ... ... | 70. 7.24 |
| 27. | සීමාසහිත ඇල්ල වලගම්බා විවිධ සේවා සමුපකාර සමිතිය | 70. 7.24 |
| 28. | සීමාසහිත උඩපේරාදෙනිය සමුපකාර කඩ සමිතිය ... | 70. 7.24 |
| 29. | සීමාසහිත වීලවාතුරෙයි සමුපකාර කඩ සමිතිය ... | 70. 7.26 |
| 30. | සීමාසහිත මහබාගේ විවිධ සේවා සමුපකාර සමිතිය ... | 70. 7.26 |
| 31. | සීමාසහිත අළුත්වෙල සමුපකාර කඩ සමිතිය ... | 70. 7.26 |
| 32. | සීමාසහිත හේවාහැට ඡන්ද කොට්ඨාශයේ තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 70. 7.27 |
| 33. | සීමාසහිත නැලිගම සමුපකාර කඩ සමිතිය ... | 70. 7.30 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ
සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්.

1970 අගෝස්තු 25 වෙනි දින,
කොළඹ, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

9–106

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ. රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | ... | ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් | ... | ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | ... | ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් | ... | ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70 7 10 සිකුරාද | .. | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 70.10. 2 සිකුරාද | .. | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | .. | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | .. | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.